# පරිසර සංරක්ෂණය සඳහා ආකල්පීය වෙනසක්


## එස්. ඒ. ජිනදාස

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති


අප අවට ඇති දෑ පරිසරය නමින් හැඳින්වේ. එය මූලික වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය. එක් කොටසක් ස්වභාව ධර්ම යෙන් නිර්මිත වී ඇත. මෙයට භූමිය, පස්, ජලය, වායුව, සාගර, ගංගා යනාදිය මෙන්ම ගහ කොළ, වනසතුන්, වනාන්තර, තණබිම් යනදිය ද ඇතුළත් වේ. අනෙක් කොටස මිනිසා විසින් නිර්මාණය කර තිබේ. නගර, ගම්, මාර්ග, ගොඩ නැගිලි, නිවාස යනාදි සියල්ල මෙයට ඇතුළත් වේ. මිනිසා විසින් මානව පරිසරයක් බිහි කරනු ලැබුවේ ස්වාභාවික පරිසරය ක්‍රමයෙන් වෙනස් කිරීමෙනි. මෑත කාලයේ දී ඇති වූ ශීඝ්‍ර සංවර්ධනයත් සමග මිනිසා විසින් ස්වාභාවික පරිසරය බොහෝ දුරට වෙනස් කර තිබේ.

නූතන කඩිනම් සංවර්ධන ක්‍රියාදාමයත් සමග මිනිසා විසින් නිරන්තරයෙන් පරිසරයට කරන ලද වෙනස්කම් හේතු කොට ගෙන පරිසරයේ මූලික සම්බන්ධතාවන් බිඳ වැටෙමින් පවතින තත්ත්වයකට අද පත් වී තිබේ. සමස්ථ පෘතුවිතලය රඳා පවත්නා භෞතික සමතුලනයට බාධා පැමිණ ඇති අතර, මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වායුගෝලය උණුසුම් වීම, සාගර ජල මට්ටම ඉහළයාම, ඕසෝන් ස්ථරය විනාශවීයාම වැනි තර්ජනවලට මුළු පෘතුවි ගෝලයම අද මුහුණ පා තිබේ.

කලාපීය වශයෙන් බැලුව ද, රටවල් වශයෙන් බැලුව ද පරිසර ප්‍රශ්ණය අද පොදු දෙයක් බවට පත් වී තිබේ. මිනිසා විසින් ස්වාභාවික සම්පත් විශාල වශයෙන් විනාශ කර ඇති අතර එමගින් සිදුවුණු පරිසර දූෂණය මගින් ගංගා - ඇළ, දොළ සහ භූමිය අපිරිසිදු කර ඇත. මේ අනුව පරිසර ප්‍රශ්න අද සෑම කෙනෙකුටම, සෑම රටකටම පොදු ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. මේ නිසා ලෝකයේ සෑම අස්සක් - මුල්ලක් නෑරම පරිසරය ගැන කථා කරනී. ඒ පිළිබඳව විශේෂ උනන්දුවක් දක්වති.

ශ්‍රී ලංකාව දිගු ඉතිහාසයක් සහිත රටකි. අපේ පැරණි සභ්‍යත්වය තුළ මිනිසා සහ පරිසරය අතර මනා සහජීවනයක් පැවතීමට අවශ්‍යව තිබූ මනා ආකල්ප සහ වයසීධර්ම සමුදායක් දක්නට ලැබුණි. බුදුදහම් මගින් පෝෂණය වූ කෘෂිකාර්මික සභ්‍යත්වයෙහි වගා ක්‍රම, සිරිත් විරිත්, පාලන ක්‍රම ආදී සෑම දෙයක්ම සකස් වී තිබුණේ ජනතාවට අවශ්‍ය ආහාර, ඇඳුම්-පැළඳුම්, නිවාස ආදී සියලු අවශ්‍යතාවන් සම්පූර්ණ කෙරෙමින් පරිසරයේ පැවැත්ම ද ආරක්ෂා කර ගැනීමට උචිත වන ආකාරයට ය.

කෙසේ වෙතත් මෙම සබඳතාවය බිඳ වැටී යන කරුණු පසුගිය කාලය තුළ දක්නට ලැබුණි. අධිරාජ්‍යවාදීන්ට යටත්වීම, වාණිජ කෘෂිකාර්මික ක්‍රම ව්‍යාප්ත වීම, ධනවාදී ආර්ථික්‍රම, වාණිජ ආර්ථික සිද්ධාන්ත මගින් ඇති කරන බලපෑම් ජනතාවගේ ජීවන රටාව මෙන්ම සංස්කෘතිය, වයසීා ධර්ම සහ ආකල්පීය පදනම ද සම්පූර්ණයෙන් ම වෙනතකට හැරවීමට සමත් විය. ජනගහණය ශීඝ්‍රයෙන් වැඩි වූ අතර, ජනතාවගේ අවශ්‍යතාවන් පිරිමසා ගැනීම සඳහා කඩිනම් සංවර්ධන ක්‍රම ඇති කරනු ලැබී ය. විශාල වශයෙන් වනාන්තර හෙළි කර ජනාවාස සහ කෘෂිකාර්මික බිම් ඇති කරනු ලැබී ය. ඒ ඒ ස්ථානයන්හි සුදුසුකම් පිළිබඳ ඇගයීමකින් තොරව නොයෙකුත් අපද්‍රව්‍ය පිට කෙරෙන කර්මාන්ත ශාලා බිහි විය. මේ සෑම දෙයකම ප්‍රතිඵලය වූයේ ශ්‍රී ලංකාවේ සම්පත් පදනම සහ පරිසරයට ප්‍රබල තර්ජනයකට මුහුණපෑමට සිදුවීම ය.

වනාන්තර විනාශය අද අප මුහුණ පා ඇති ප්‍රබල පාරිසරික ගැටළුවකි. ශ්‍රී ලංකාවේ වන ආවරණය 1963 දී මුළු දිවයිනෙන් 44% ක් වූ නමුත්, අද එය 21% දක්වා අඩු වී තිබේ. පසුගිය දශක තුනක කාලය තුළ හෙක්ටයාර් දශලක්ෂයක පමණ ස්වාභාවික වනාන්තර විනාශ වී තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පස් සේදීයාම, නායයෑම්, ජල ගැලීම්, නියඟය, වනසතුන් විනාශ වීයාම, ජල සම්පත් සිඳීයාම වැනි ප්‍රශ්නවලට මුහුණදීමට සිදු වී ඇත. පරිසරයට අහිසි ආකාරයට කෙරෙන කෘෂි කාර්මික ක්‍රියාවලි මෙන්ම වෙනත් මානව ක්‍රියාවලීන් ද හේතු කොට ගෙන මෑත කාලයේ දී පාංශුඛාදනය අතිශය උග්‍ර වී තිබේ. ශ්‍රී ලංකාවේ උස්බිම්වලින් 60% ක් පමණ පස් සේදීයාමේ තර්ජනයට මුහුණ පා ඇති බව ගණන් බැලීම්වලින් පෙනී ගොස් ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගංගා පත්ල පිරියාම, ජලාශවල රොන්මඩ තැන්පත්වීම, පසේ සාරවත් බව අඩුවීම වැනි ගැටලු ඇති වී තිබේ. ශ්‍රී ලංකාව සාමාන්‍යයෙන් ජල සම්පත් අතින් පොහොසත් රටක් වශයෙන් පිළි ගැනෙන නමුත්, වර්තමාන තත්ත්වය අනුව මෙම ජලසම්පත් විශාල වශයෙන් විනාශ වී යන බවට සාක්ෂි දක්නට ලැබේ. පිරිසිදු ජලය දුර්ලභ සම්පතක් බවට පත් වෙමින් පවතී. බොහෝ ප්‍රදේශවල ජල මට්ටම අඩුවී යාමේ සාක්ෂි ඇත. ජලයේ ගුණාත්මක බව ද ප්‍රබල පිරිහීම්වලට මුහුණ පා ඇති බවට සාක්ෂි තිබේ. කර්මාන්තවලින් නිකුත් කෙරෙන අපද්‍රව්‍ය, කෘෂිකර්මාන්තයට යොදන රසායනික ද්‍රව්‍ය, කැළිකසල ජල දූෂණයට ප්‍රධාන හේතුන් වශයෙන් ගණන් ගැනේ.

වනාන්තර විශාල වශයෙන් හෙළි කිරීම නිසා වනසතුන්ගේ වාසභූමිය ක්‍රමයෙන් විනාශ වෙමින් පවතී. පසුගිය කාලසීමාව තුළ සංවර්ධනයේ නාමයෙන් අප දිවයිනෙන් සඳහටම අතුරුදහන් වූ ශාඛ හා ජීව ප්‍රමාණය අතිමහත් ය. මෙහි ප්‍රතිඵලය වශයෙන් ජෛව විවිධත්වය දිනෙන් දින අඩු වී යාමේ තර්ජනයට මුහුණ පා ඇත.

ජලය පමණක් නොව වායුව ද ක්‍රමයෙන් දූෂණය වී යන ආකාරයක් දැකිය හැකි ය. විශේෂයෙන් නාගරික ප්‍රදේශවල වායු දූෂණය දැන් උග්‍ර ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. මනා සැලසුමකින් තොරව වෙරළ සම්පත් භාවිතා කිරීම නිසා ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසරයේ සමතුලනය බිඳී ගොස් ඇත. ලෝකයේ දක්නට ලැබෙන ඉතාමත් ම අගනා වෙරළ සම්පත් අප දැනටමත් ඒවායින් බොහොමයක් විනාශ කර තිබේ. කොරල් හා කඩොලාන ඒවායේ ස්වාභාවික වර්ධන සීමාවන් ඉක්මවා උපයෝගී කරගැනීම නිසා විනාශ වී යාමේ තර්ජන වලට මුහුණ පා ඇත. සංචාරක ව්‍යාපාරය, වෙරළබඩ ජනාවාස, දරිද්‍රතාවය, කර්මාන්ත වලින් පිටකරන අපද්‍රව්‍ය වෙරළට මුදාහැරීම මගින් වෙරළ දූෂණය නිරන්තරයෙන් සිදු කෙරේ.

සැලැස්මකින් තොරව සිදුවන වර්ධනය හේතු කොට ගෙන නාගරික කලාපයන්හි පැල්පත්, මුඩුක්කු කලාප බිහි වී ඇත. මේවා ආශ්‍රිත පරිසර ගැටළු රාශියකි. කැළි කසල නාගරික ප්‍රදේශවල අද ප්‍රබල පාරිසරික ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. පරිසර සංරක්ෂණය ගැන තැකීමක් නැතිව ඇති කරන ලද කර්මාන්ත මගින් සිදුවන පරිසර දූෂණය අද නාගරික කලාපවල පමණක් නොව සමහර ගම්බද ප්‍රදේශවල ප්‍රබල පරිසර ගැටළු ඇති කිරීමට හේතු වී ඇත. මැණික්, මිනිරන්, වැනි ආකර කර්මාන්ත මගින් සමහර ප්‍රදේශවල ජීවත්වන ජනතාවට පරිසර ගැටළු ඇති කර ඇති අතරම, සම්පත් පදනම විනාශවීමේ ද හේතූන් වී ඇත.

අද අප මුහුණ පා ඇති මෙම පරිසර ප්‍රශ්නයන් විසඳීම කෙරෙහි රජයේ අවධානය යොමු වූයේ මෑතක සිට ය. 1980 දී පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා වූ වර්තමාන ජනාධිපතිතුමා පරිසරය සුරැකීම සඳහා රාජ්‍ය අවධානය යොමු කිරීම මෑත ඉතිහාසයේ දක්නට ලැබෙන වැදගත්ම සිද්ධියකි. ඒතාක් කල් සම්පූර්ණයෙන්ම වාගේ නොසළකා හැර තිබූ පරිසර අවධානය නව මගකට යොමු කරමින් 1980 දී එතුමාගේ මැදිහත්වීමෙන් ජාතික

පාරිසරික පනත සම්මත කරනු ලැබී ය. අනතුරුව 1981 මධ්‍යම පරිසර අධිකාරිය එම අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ලදී. පරිසරය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම, අධ්‍යයනයන් කිරීම, උපදෙස්දීම හා සමායෝජන කටයුතු මෙම අධිකාරියට පැවරිණ. මෙම කටයුතු තව දුරටත් පහසු කරලීමේ අවශ්‍යතාව ද ඇතිව 1988 දී ජාතික පාරිසරික පනත සංශෝධනය කරනු ලැබී ය. එයට අදාළ ව රෙගුලාසි දැන් සකස් කර ඇති අතර පරිසර දූෂණය වැළැක්වීමේහිලා අවශ්‍ය නීතිමය පියවර ද දැන් ක්‍රියාත්මක කෙරේ. මෙයට අමතරව මෑතක දී පරිසර අමාත්‍යාංශයක් ද පිහිටුවීමෙන් පරිසරය ගැන දක්වන රාජ්‍ය අනුග්‍රහය පැහැදිළි වේ.

පරිසරය සුරැකීම සඳහා ජාතික මට්ටමින් දැන් ඉතා පුළුල් වැඩසටහන් ක්‍රියාත්මක වේ. කර්මාන්ත මගින් සිදුවන පරිසර දූෂණය පාලනය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මගින් බලපත්‍ර නිකුත් කිරීම අරඹා ඇත. නව ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඒ මගින් පරිසරයට ඇතිවන බලපෑම් ඇගයුම් කිරීමේ ක්‍රියාකාරකම් දැන් සකස් වෙමින් පවතී. පරිසරය සුරැකීම සඳහා ජනතාවගේ ක්‍රියාකාරී සහයෝගය ලබා ගැනීමේ අරමුණින් ජනතාව දැනුවත් කිරීමේ පුළුල් වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. විදේශ ආධාර යටතේ ව්‍යාපෘති රැසක් පරිසරය රැක ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක වේ. මේ අන්දමේ විශාල වැඩපිළිවෙළක් දියත් කළත් එපමණකින් ම අපගේ පරිසරය ආරක්ෂා වෙතැයි බලාපොරොත්තු වීම අසීරු ය. මීට හේතු වන්නේ පරිසර ප්‍රශ්න ඇතිවීමට අප හැමදෙනාම කිසියම් ප්‍රමාණයකින් දායක වී ඇති හෙයිනි. මිනිසකු උපන් දා සිට මැරෙන තෙක් ම සිදු කෙරෙන සෑම කටයුත්තකින් ම පරිසරය සමග ගැටීමක් සිදුවේ. මෙම ගැටීම් හේතු කොට ගෙන ස්වාභාවික පරිසරය වෙනස් කම්වලට භාජනය වේ. මෙම වෙනස්කම් සමහර විට පාරිසරික සමතුලනයට බාධා පමුණුවයි. මෙහි දී ඉතාමත් අවශ්‍ය වන්නේ අප හැමදෙනාගේ ම කරන කියන සෑම ක්‍රියාවලියක දීම පරිසරයට හානියක් නොවන ආකාරයට හෝ එකී පරිසරයට හානිය අඩුවන ආකාරයට හෝ කටයුතු කිරීමයි. ඉතා සුළු මට්ටමකින් හෝ අප හැම දෙනෙකුම පරිසරය සුරැකීමට ක්‍රියාකාරී අන්දමකින් සහයෝගය දෙන්නේ නම් එම ඇතිවන බලපෑම අතිවිශාල වේ. ජනතාවගේ පූර්ණ සහයෝගය නොමැතිව කවර ක්‍රියාමාර්ගයක්වත් ඉටු කර ගත නොහැකි ය.

පරිසරය සුරැකීම සඳහා කොපමණ නීතිරීති ක්‍රියාත්මක කළ ද කොපමණ වැඩ සටහන් දියත් කළ ද, එමගින් ලබා ගත හැකි ප්‍රතිඵල ඉතාමත් සීමිත වේ. ඕනෑම නීතියක් නිසි අයුරු ක්‍රියාත්මක වන්නේ ඒ සඳහා ලැබෙන සාමාජීය පිළිගැනුම හා අනුබලය මතයි. ව්‍යාපෘතීන් සාර්ථකව මෙහෙයවිය හැකි වන්නේ ඒ සඳහා ජනතාවගෙන් ලැබෙන ක්‍රියාකාරී සහයෝගය මතයි. නොඑසේ නම් කෙතරම් හොඳින් සකස් කළ නීතීන් හෝ මැනවින් සැලසුම් කරන ලද ව්‍යාපෘතීන් හෝ මගින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත නොහැකි වේ.

මේ සඳහා මූලික අවශ්‍යතාවක් වන්නේ සමස්ථ ජනතාවගේම, සෑම රටවැසියෙක් තුළ ම ඇති විය යුතු ආකල්පීය වෙනසකි. යටත් විජිතවාදය අප මෙහෙයවනු ලබන වාණිජ ආර්ථික සිද්ධාන්ත, පුද්ගල ලාභ ප්‍රයෝජන පදනම් වූ වයඹ ධර්ම පද්ධතියෙන් පරිසරය සුරැකීමට හිතකර ආකල්පීය පදනමක් බිහි කර නොමැති බව පිළිගත යුතු ය. මේ හේතු කොට ගෙන පරිසරයට හිත කර වයඹ ධර්ම සහ ආකල්ප ජනිත කර ගැනීමටත්, ව්‍යාප්ත කර ගැනීමටත් මෙය ඉතාමත් ම උචිත කාලයයි. මේ සඳහා පූජ්‍ය පක්ෂ, රාජ්‍ය නොවන සංවිධාන, දේශපාලන සහ සමාජ නායකත්වය පෙරමුණ ගැනීම අවශ්‍ය වේ. මිනිසා සහ පරිසරය අතර මනා සහජීවනයක් ගොඩ නඟා ගතහැකි ආකල්පීය පදනමක් දැමිය හැකි වන්නේ සියලුම දෙනාගේ පූර්ණ ඇප කැපවීමකින් සහ සහයෝගයෙන් පමණි. ඒ සඳහා සෑම දෙනාම ඒකාවන්ව අත්වැල් බැඳ ගැනීමට කාලය දැන් පැමිණ තිබේ.

අනාගත පරම්පරාවේ ද අවශ්‍යතවන් සඳහා ස්වාභාවික සම්පත් පදනම ආරක්ෂා කර ගනිමින් නිරන්තර සංවර්ධන අත්තිවාරම දැමිය හැකි වන්නේ එවන් ඒකාබද්ධ ප්‍රයත්නයකින් පමණි.